සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

(01) ඕනෑම සමාජ පද්ධතියක් නිෂ්පාදනයේ දී තේරීමක් කිරීමට සිදුවන්නේ,
(1) සම්පත්වල සීමිතබව හා විකල්ප ප්‍රයෝජන සහිතවීමයි.
(2) මිනිස් වුවමනා සීමිතවීම හා සම්පත් අසීමිතවීම නිසාය.
(3) නිෂ්පාදන සම්පත් ප්‍රයෝජනයට ගැනීමේදී ආවස්ථික පිරිවැයක් හටගන්නා බැවිනි.
(4) මිනිස් වුවමනා ඉටුකරගැනීමට සම්පත් සුරක්ෂිත කළ යුතු බැවිනි.
(5) මිනිස් අවශ්‍යතාවයන්ට සාපේක්ෂව සම්පත් අසීමිත බැවිනි. (......)

(02) අවර්ථික සම්පත් පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ශුන්‍ය මිලකදී අසීමිතව සපයන භාණ්ඩ
(2) ඕනෑම මිලකදී අසීමිතව සපයන භාණ්ඩ
(3) නිෂ්පාදනයේ දී සීමා සහිත සැපයුමක් ඇති සම්පත්
(4) ශුන්‍ය මිලකදී අසීමිතව සපයන සම්පත්
(5) නිෂ්පාදනයේදී ස්වභාවිකව නැවත ප්‍රතිජනනය වන සම්පත් (......)

(03) කිසියම් ආර්ථිකයකට තම නිෂ්පාදන හැකියා මට්ටම ඉක්මවූ භාණ්ඩ සංයෝගයක් පරිභෝජනය කළ හැක්කේ,
(1) වඩාත් කාර්යක්ෂමව නිෂ්පාදනය කළහැකි භාණ්ඩ නිෂ්පාදනයකර ජාත්‍යන්තර වෙළඳාමට පිවිසීමෙන් රටවල් අතර හුවමාරු කිරීමෙන්.
(2) වඩා කාර්යක්ෂමව නිෂ්පාදනය කළහැකි භාණ්ඩය පමණක් තෝරා දේශීය පරිභෝජනයට සීමා කිරීම.
(3) රට රටවල් අතර බහුපාර්ශවීය වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මඟින්.
(4) භාණ්ඩ දෙකක් පමණක් නිෂ්පාදනය කිරීම මඟින්.
(5) වඩා අකාර්යක්ෂමව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩයේ නිෂ්පාදනය අත්හිටුවීම මඟින්. (......)

(04) ''ආවස්ථික පිරිවැයක්'' සහිත භාණ්ඩයක් සම්බන්ධව පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) වෙළඳපලේ භාණ්ඩ හිඟයක් තිබීම.
(2) භාණ්ඩයට මිලක් නියම වී තිබීම.
(3) රජය ජනතාවට නොමිලේ ලබාදීම.
(4) නිෂ්පාදනයේ දී සම්පත්වල කැපකිරීමක් නොමැතිවීම.
(5) වෙළඳපලේ හුවමාරු වීම. (......)

(05) ආර්ථිකයේ කාර්යක්ෂමතාවය අත්පත් කර ගැනීමට අනිවාර්යයෙන්ම ඉටුවිය යුතු කොන්දේසි වන්නේ,
(1) සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාව හා පූර්ණ සේවා නියුක්තිය.
(2) සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාව හා පූර්ණ නිෂ්පාදනය.
(3) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා පූර්ණ නිෂ්පාදනය.
(4) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය.
(5) පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය. (......)

(06) භාණ්ඩයේ මිල හා ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාවයක් දැකිය හැක්කේ මින් කුමන භාණ්ඩයක් සඳහා ද?

(1) බාල භාණ්ඩ (2) ගිෆන් භාණ්ඩ (3) සාමාන්‍ය භාණ්ඩ
(4) ආදේශන භාණ්ඩ (5) අනුපූරක භාණ්ඩ (......)

(07) භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවයක් දැකිය හැක්කේ කවර සාධකය මඟින් ද?

(1) අන් භාණ්ඩවල මිල ගණන් වැඩිවීම.
(2) අනාගතයේ භාණ්ඩයේ මිල වැඩිවේ යැයි අපේක්ෂා කිරීම.
(3) නිෂ්පාදන සාධක මිල ගණන් වෙනස් වීම.
(4) සැපයුම්කරුවන්ගේ ලාභය අඩු වැඩි වීම.
(5) තාක්ෂණික ශිල්පීය ඥාණය. (......)

(08) රජය මඟින් පනවන ලද දේශීය බද්දක් සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයාට දැරීමට සිදුවන්නේ එම භාණ්ඩයේ,

(1) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට අඩු අගයකදී ය.
(2) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට වැඩි අගයකදී ය.
(3) මිල ඉල්ලුම් නම්‍යතාවය ඒකීය අගයකදී ය.
(4) මිල ඉල්ලුම් නම්‍යතාවය අපරිමිත අගයකදී ය.
(5) මිල ඉල්ලුම් නම්‍යතාවය පූර්ණ අනම්‍ය අගයකදී ය. (......)

(09) වෙළඳපලේ මත්පැන් සඳහා අනම්‍ය ඉල්ලුමක් පවතින විට රජය බද්දක් පැනවීමෙන් පසු ඉහළ ගියේ නම්,

(1) ව්‍යාපාරික අයභාරය ඉහළ යයි. (2) ව්‍යාපාරික අයභාරය පහළ යයි.
(3) පාරිභෝගික පැහැදීම පහළ යයි. (4) රජයේ අයභාරය පහළ යයි.
(5) ව්‍යාපාරික අයභාරයේ වෙනසක් නොවේ. (......)

(10) භාණ්ඩයේ මිල සාමාන්‍ය අයභාරයට හා ආන්තික අයභාරයට සමාන වන්නේ,


(1) පූර්ණතරගකාරී වෙළඳපලක (2) ඒකාධිකාරී වෙළඳපලක
(3) ඒකාධිකාරී තරග වෙළඳපලක (4) කෘතිය්‍යාධිකාරී වෙළඳපලක
(5) භාණ්ඩ හා සේවා වෙළඳපලක (......)

(11) සලකා බලන භාණ්ඩය බාල භාණ්ඩයක් නම් පාරිභෝගිකයාගේ ආදායම අඩුවෙත්ම දැනට වෙළඳපලේ තීරණය වී ඇති සමතුලිත මිලට හා ප්‍රමාණයට කුමක් සිදු විය හැකිද?

(1) සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය ද වැඩිවේ.
(2) සමතුලිත මිල පහළ යන අතර සමතුලිත ප්‍රමාණය ද පහළ යයි.
(3) සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය අඩුවේ.
(4) සමතුලිත මිල පහළ යන අතර සමතුලිත ප්‍රමාණය වැඩිවේ.
(5) සමතුලිත මිල හා ප්‍රමාණයේ වෙනසක් සිදු නොවේ. (......)

(12) වෙළඳපලේ A භාණ්ඩය සඳහා රජය අලෙවි බද්දක් පැනවීමෙන් පසු සැපයුම් වක්‍රය S විතැන්විය. බද්ද පැනවීමෙන් පසු හා පැනවීමට පෙර පාරිභෝගික අතිරික්තය පිළිවෙලින් දක්වා ඇත්තේ

| | බදු පැනවීමෙන් | බදු පැනවීමට පෙර |
|---|---|---|
| (1) | B+C+D | A |
| (2) | A | A+B+C+D |
| (3) | B | H+G+J+F |
| (4) | J+K | H+G+F+J |
| (5) | DF | H+B+C+G |




(......)

(13) එක්තරා වෙළඳපලක $x$ භාණ්ඩයේ ඉල්ලුම Qd - 140 - 2P හා සැපුයම Qs = 60 + 3P වේ. රජය මෙම භාණ්ඩය අලෙවිකළ හැකි උපරිම මිල ලෙස රු. 20/= ප්‍රකාශයට පත්කිරීමෙන් පසු වෙළඳපලේ $x$ භාණ්ඩය සම්බන්ධයෙන්,

(1) භාණ්ඩ ඒකක 60 ක අධි ඉල්ලුමක් ඇතිවේ.
(2) භාණ්ඩ ඒකක 160 ක අධි ඉල්ලුමක් ඇතිවේ.
(3) භාණ්ඩ ඒකක 60 ක අධි සැපයුමක් ඇතිවේ.
(4) භාණ්ඩ ඒකක 100 ක අධි සැපයුමක් හට ගනී.
(5) භාණ්ඩ ඒකක 160 ක අධි ඉල්ලුමක් හටගනී. (......)

(14) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට වැඩි පාරිභෝගික භාණ්යක් සඳහා රජය විසින් සහනාධාරයක් ලබාදෙන ලදී. එහි වාසිය අත්පත්වන්නේ,

(1) සම්පූර්ණයෙන්ම නිෂ්පදකයාට.
(2) සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයාට.
(3) නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට සමානව.
(4) නිෂ්පාදකයාට වඩා වැඩි වාසියක් පාරිභෝගිකයාට.
(5) පාරිභෝගිකයාට වඩා වැඩි වාසියක් නිෂ්පදකයාට. (......)

(15) වෙළඳල ආර්ථිකයක දැකිය හැකි ප්‍රධානතම ලක්‍ෂණයකි,

(1) සම්පත්වල අයිතිය රාජ්‍ය සතුවීම.
(2) සම්පත්වල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික අංශය සතුවීම.
(3) මූලික ආර්ථික ප්‍රශ්න මධ්‍යගත සැලසුම් යාන්ත්‍රණය මඟින් විසඳීම.
(4) රජයේ කාර්ය භාරය අසීමිත වීම.
(5) මිල යාන්ත්‍රණය මඟින් ආර්ථිකය මෙහෙයවීම. (......)

(16) වෙළඳපල ආර්ථිකයක ''ලාභය'' මඟින් සිදුකරන කාර්යයක් වන්නේ මින් කුමක් ද?

(1) වෙළඳපලට සංඥා සැපයීම.
(2) යටිතල පහසුකම් සැපයීමට මඟ පෙන්වීම.
(3) ශුභ සාධන භාණ්ඩ නිෂ්පාදනයට අභිප්‍රේරණය සැපයීම.
(4) පොදු භාණ්ඩ සැපයීමට සම්පත් බෙදා වෙන් කිරීම.
(5) ඉහත සඳහන් සියල්ලම. (......)

(17) මධ්‍යගත සැළසුම් අර්ථ ක්‍රමයක සිට වෙළඳපල ආර්ථිකය කරා මාරු වූ රටවල් වර්තමානයේ හඳුන්වන්නේ,

(1) නව කාර්මික රටවල්
(2) සාක් රටවල්
(3) මධ්‍යගත සැළසුම් ආර්ථික රටවල්
(4) පෞද්ගලික ව්‍යවසාය ආර්ථික රටවල්
(5) පරිවර්තන ආර්ථික රටවල් (......)

(18) දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ සාමාන්‍ය පිරිවැය වක්‍රයේ ඉහළ ප්‍රදේශයෙන් පෙන්නුම් කරන්නේ,

(1) පරමාණුකූල පිරිමැසුම්
(2) ස්ථාවර පරමාණුකූල ඵල
(3) පරමාණුකූල නොපිරිවැසුම්
(4) ස්ථාවර ආවස්ථික පිරිවැය
(5) ස්ථාවර ආවස්ථික පිරිවැය (......)

(19) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක කෙටිකාලයක දී තම නිෂ්පාදන සම්බන්ධව ආන්තික පිරිවැය MC ආන්තික අයහාරයට MR සමාන මට්ටමක පවතීනම් මින් පැහැදිලි වන්නේ එම ආයතනය,

(1) ප්‍රාමාණික ලබන මට්ටමක කටයුතු කරන බව.
(2) ආර්ථික අලාභ ලබන මට්ටමක කටයුතු කරන බව.
(3) ආර්ථික ලාභ උපරිම කරන නිෂ්පාදන මට්ටමක කටයුතු කරන බව.
(4) විචල්‍ය පිරිවැය පියවාගත නොහැකි මට්ටමක කටයුතු කරන බව.
(5) මුළු පිරිවැය මුළු අයහාරයට සමාන වී ඇති බව. (......)

(20) පූර්ණ තරගකාරී ආයතනයක *y* භාණ්ඩය පිළිබඳ මුළු පිරිවැය දත්ත පහත දැක්වේ.

| නිමවුම | මුළු පිරිවැය (රු. මි.) |
|---|---|
| 0 | 3000 |
| 10 | 3600 |
| 20 | 4100 |
| 30 | 4400 |
| 40 | 4600 |
| 50 | 5000 |

භාණ් 40 නිෂ්පාදනයේ දී ආන්තික පිරිවැය වනුයේ,

(1) රු. මි. 20 (2) රු. මි. 200 (3) රු. මි. 1600 (4) රු. මි. 3000 (5) රු. මි. 115 (......)

(21) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක ''සැපයුම'' ආරම්භ කරනු ලබන්නේ,

(1) භාණ්ඩයේ මුළු පිරිවැය ආවරණය වීමෙන් පසුවය.

(2) භාණ්ඩයේ ආන්තික පිරිවැය ආවරණය වීමෙන් පසුවය.

(3) භාණ්ඩයේ අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය ආවරණය වීමෙන් පසුවය.

(4) භාණ්ඩයේ සාමාන්‍ය මුළු පිරිවැය ආවරණය වීමෙන් පසුවය.

(5) මිල ආන්තික අයභාරයට සමාන වූ විටදීය. (......)

(22) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක කෙටිකාලයක දී තම නිෂ්පාදන ක්‍රියාවලියේ දී මුහුණ පෑමට සිදුවන සංරෝධක ලෙස දැක්විය හැක්කේ,

(1) භාණ්ඩයේ මිල හා තාක්ෂණය (2) මිල හා විචල්‍ය සාධක

(3) විචල්‍ය සාධක හා තාක්ෂණය (4) මිල හා සැපයුම්කරුවන්

(5) තාක්ෂණය හා සැපයුම්කරුවන් (......)

(23) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ පැහැදිලිව දක්නට ලැබෙන ලක්ෂණයකි,

(1) විචල්‍ය යෙදවුම් වල කාර්යක්ෂමතාවය වැඩිවීම හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය පහළ වැටීම.

(2) විචල්‍ය යෙදවුම් වල කාර්යක්ෂමතාවය අඩුවීම හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අඩුවීම.

(3) විචල්‍ය යෙදවුම් වල කාර්යක්ෂමතාවය අඩුවීම හා ආන්තික පිරිවැය වැඩිවීම.

(4) විචල්‍ය යෙදවුම් වල කාර්යක්ෂමතාවය වැඩිවීම හා මුළු පිරිවැය අඩුවීම.

(5) විචල්‍ය යෙදවුම් වල කාර්යක්ෂමතාවය අඩුවීම හා ආන්තික පිරිවැය අඩුවීම. (......)

(24) කෙටි කාලීන නිෂ්පාදනයේ යෙදෙන ආයතනයක් නිෂ්පාදන කටයුතු නතර කිරීමට හෝ වසා දැමීමට තීරණය කරනු ලබන්නේ,

(1) විචල්‍ය පිරිවැය පියවාගත නොහැකි වූ විටදී ය.

(2) ස්ථාවර පිරිවැය පියවාගත නොහැකි වූ විටදී ය.

(3) මුළු පිරිවැය අයභාරයෙන් ආවරණය නොවූ විටදී ය.

(4) ලාභ ශූන්‍ය මට්ටමකදී ය.

(5) ආර්ථික අලාභ ලබන මට්ටමකදී ය. (......)

(25) සමජාතිය හා ප්‍රභේදනය වූ භාණ්ඩ දක්නට ලැබෙන වෙළඳපල ලෙස දැක්විය හැක්කේ,

(1) කතිපයාධිකාරී වෙළඳපල (2) ඒකාධිකාරී වෙළඳපල

(3) ඒකාධිකාරී තරග වෙළඳපල (4) පූර්ණ තරගකාරී වෙළඳපල

(5) සාධක වෙළඳපල (......)

(26) සාධක මිලට ශුද්ධ දේශීය නිෂ්පාදනය නිවැරැදිව දක්වා ඇත්තේ,

(1) වෙළඳමිලට දළ ජාතික ආදායම ක්ෂයවීම්

(2) සාධන මිලට දළ දේශිය ආදායම ක්ෂයවීම්

(3) ශුද්ධ දේශීය ආදායම + ක්ෂයවීම්

(4) දළ ජාතික ආදායම + ශුද්ධ වක්‍ර බදු

(5) සාධන මිලට දළ ජාතික නිෂ්පදානය ක්ෂයවීම් (......)

(27) සරල ආර්ථිකයක පරිභෝජනය $C = 600 + 0.8y$ නම් ආදායම රු. 1200 දී ඉතිරි කිරීම් නිවැරදිව දැක්වෙන්නේ,

(1) රු. මි. 360 (2) රු. මි. 240 (3) රු. මි. 600 (4) රු. මි. 840 (5) රු. මි. 1800 (......)

(28) සංවෘත ආර්ථිකයක සමතුලිතය දැක්වෙන්නේ,

(1) $y = C + I$ (2) $y = C$ (3) $y = C + I + G$

(4) $y = C + I + G + x - m$ (5) $S = I$ (......)

(29) පාරිභෝගිකයාගේ ආදායම ශූන්‍ය අවස්ථාවේදී කරනු ලබන පරිභෝජනය හැඳින්විය හැක්කේ,

(1) ස්වාධීන පරිභෝජනය ලෙසයි.

(2) පෙළඹුන පරිභෝජනය ලෙසයි.

(3) වැයකළ හැකි ආදායමේ පරිභෝජනය ලෙසයි.

(4) බදු ගෙවීමට ප්‍රථම ආදායමෙන් කරනු ලබන පරිභෝජනය ලෙසයි.

(5) ඉතිරි කිරීමට ප්‍රථම කරනු ලබන පරිභෝජනය ලෙසයි. (......)

(30) සංවෘත ආර්ථිකයක පරිභෝජනය $C = 200 + 0.60$ නම් ආයෝජන ගුණකය නිවැරදිව ප්‍රකාශ වී ඇත්තේ,

(1) 0.25 (2) 4 (3) 2.5 (4) 1.6 (5) 1.7 (......)

(31) විවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 300 + 0.754d$ වන අතර TR (සංක්‍රාම) රු. 20 නම් ආර්ථිකයේ ඉරතුරුම් ශ්‍රිතය වන්නේ,

(1) $S = -300 + 0.75y$ (2) $S = 300 + 0.25y$

(3) $S = -300 + 0.25y$ (4) $S = -315 + 0.25y$

(5) $S = -285 + 0.25y$ (......)

(32) බාටර් ආර්ථිකයේ දැකිය හැකි ප්‍රධානතම ගැටළුව වන්නේ මින් කවරක් ද?

(1) වෙළඳපල ප්‍රසාරණයට ඇති බාධා. (2) වුවමනා අතර ද්විසම්පාතිකයක් අවශ්‍ය වීම.

(3) ගෙන යාමේ අපහසුව. (4) පොදුවේ පිළිනොගැනීම.

(5) හඳුනා ගැනීමේ අපහසුව. (......)

(33) ආර්ථිකයක පදනම් මුදල් ලෙස ගණනය වන්නේ,

(1) බලපත්‍ර ලාභී මූල්‍ය ආයතනවල ඇති තැන්පතු

(2) ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතනවල ඇති ජනතාව සතු ඉල්ලුම් තැන්පතු

(3) මහජනයා සතු ව්‍යවහාර මුදල්

(4) වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු

(5) මහජනයා හා වාණිජ බැංකුවල ඇති ව්‍යවහාර මුදල් හා වාණිජ බැංකු සතු මහ බැංකුවේ ඇති තැන්පතු

(......)

(34) වාණිජ බැංකුවක ශේෂපත්‍රයේ දැක්වෙන වත්කම් වලින් අධි ද්‍රවශීලවත්කමක් ලෙස සැලකිය හැක්කේ,

(1) භාණ්ඩාගාර බැඳුම්කර (2) භාණ්ඩාගාර බිල්පත් (3) ණය දීම
(4) ඉල්ලුම් තැන්පතු (5) කාලීන තැන්පතු (......)

(35) වාණිජ බැංකු ණය ලබාදීම කරනු ලබන්නේ බැංකුව සතු,

(1) අධි සංචිත මගිනි.
(2) ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය මතයි.
(3) මුළු තැන්පතු මෙන් කිහිප ගුණයකි.
(4) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ ප්‍රමාණය මතයි.
(5) මහ බැංකුවේ තැන්පත් පදනම් මුදල් මතයි. (......)

(36) මූර්ත නිෂ්පාදනය ගණනය කිරීමේදී භාවිතා කරන මිල දර්ශකය වන්නේ,

(1) ගම්‍ය මිල දර්ශකය (2) තොග මිල දර්ශකය
(3) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය (4) කොළඹ දිස්ත්‍රික් මිල දර්ශකය
(5) ආනයන අපනයන මිල දර්ශකය (......)

(37) නිරුද්ධමනය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) පොදු මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාමකි.
(2) පොදු මිල මට්ටමේ අඛණ්ඩ පහළ යාමකි.
(3) උද්ධමන අනුපාතයේ ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවීමයි.
(4) උද්ධමන අනුපාතයේ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවීමයි.
(5) උද්ධමන අනුපාතයේ ප්‍රතිශතාත්මකව අඛණ්ඩ වැඩිවීමයි. (......)

(38) එක්තරා ආර්ථිකයක උද්ධමන අනුපාතය 14% දක්වා වැඩි වූ අතර නාමික පොලී අනුපාතය 20% ක් විය. එම ආර්ථිකයේ මූර්ත පොලී අනුපාතය වන්නේ,

(1) -6% (2) 6% (3) 4.5 (4) -4.5 (5) 34% (......)

(39) ඕනෑම ආර්ථිකයක සාර්ව ආර්ථික අරමුණක් වන්නේ මිල ස්ථායිතාවය යහපත් ලෙස පවත්වා ගැනීමයි. මේ සඳහා යොදා ගනු ලබන ප්‍රතිපත්තිය වන්නේ,

(1) විවට වෙළඳ ප්‍රතිපත්තිය.
(2) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය.
(3) මූල්‍ය ප්‍රතිපත්තිය.
(4) ඒක්ෂණික ණය මුදල් පොලී අනුපාතය පාලනය කිරීම
(5) ඍජු පාලන ප්‍රතිපත්තිය. (......)

(40) මුල්‍ය ප්‍රතිපත්තිය යනු,

(1) පොලී අනුපාතය හා මුදල් සැපයුම පාලනය කිරීමට යොදා ගනු ලබන ප්‍රතිපත්තියයි.
(2) විදේශ විනිමය පාලනය කිරීමේ ප්‍රතිපත්තියයි.
(3) රාජ්‍ය බදු හා ආදායම් පාලනය කිරීමේ ප්‍රතිපත්තියයි.
(4) රාජ්‍ය ණය හා අය වැය පාලනය කිරීමේ ප්‍රතිපත්තියයි.
(5) ඉහත සඳහන් සියල්ලම මුල්‍ය ප්‍රතිපත්තියයි. (......)

The National e-learning Portal for The General Education

(41) මුදල් ප්‍රමාණවාදී විග්‍රහයට අනුව,

(1) මුදල් සංසරණ ප්‍රවේගය හා මූර්ත නිෂ්පාදනය ස්ථාවරයයි උපකල්පනය කරයි.

(2) නිමවුම හා මුදල් සංසරණ ප්‍රවේගය සමානුපාතිකව වැඩි වේ.

(3) භාණ්ඩ හා සේවාවල මිල මුදල් සැපයුමේ වැඩිවීම අනුවම ඉහළ යයි.

(4) මුදල් සැපයුමට සමානුපාතිකව උද්ධමනය ඉහළ යයි.

(5) නිෂ්පාදන සාධක පිරිවැය ඉහල යන ප්‍රමාණය අනුව උද්ධමනය වැඩිවේ. (......)

(42) මහ බැංකුව වාණිජ බැංකු සමග ප්‍රති විකුණුම් ගිවිසුම් ක්‍රියාත්මක කළ විට,

(1) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපලේ පොලී අනුපාතය ඉහළ යයි.

(2) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපලේ පොලී අනුපාතය පහළ වැටේ.

(3) බලපත්‍ර ලාභි මුල්‍ය ආයතනවල ණය දීම ඉහළ යයි.

(4) ප්‍රාග්ධන වෙළඳපලේ ගණුදෙනු ප්‍රසාරණය වේ.

(5) මුදල් වෙළඳපලේ ගණුදෙනු සංකෝචනය වේ. (......)

(43) මුදලට ඇති ඉල්ලුම තීරණය වන සාධක ලෙස වඩාත් නිවැරදි වන්නේ,

(1) ආදායම හා වියදම අනුව

(2) අවශ්‍යතා හා වුවමනා අනුව

(3) ද්‍රවශීලතා වරණය අනුව

(4) පොලිය හා ආදායම අනුව

(5) ආදායම හා සමාජ මට්ටම අනුව (......)

(44) 'පොදු භාණ්ඩ යන අර්ථය වඩාත් හොඳින් පැහැදිලි වන්නේ කුමන ප්‍රකාශය මඟින් ද ?

(1) දේශ සීමා ඉක්මවා ප්‍රතිලාභ ලැබෙන තරඟකාරීත්වයක් නොමැති පාරිසරික සම්පත්ය.

(2) පරිභෝජනයේ දී පෞද්ගලික ප්‍රතිලාභ අත්කර දෙන භාණ්ඩ.

(3) සාමුහිකව පරිභෝජනය කළහැකි තරගකාරීත්වයක් දක්නට ලැබෙන භාණ්ඩ.

(4) ගෙවීමක් කරන පුද්ගලයාට පමණක් භාණ්ඩයේ පරිභෝජනය සීමා වීම හා ආන්තික පිරිවැය ධන අගයක් ගැනීම.

(5) සාමුහිකව පරිභෝජනය කළ හැකි තරගයක් නොමැති හා අතිරේක පාරිභෝගිකයෙකුගේ පරිභෝජනයේ දී ආන්තික පිරිවැය ශුන්‍ය භාණ්ඩ.

(......)

(45) ශුභ සාධන භාණ්ඩයක් පාරිභෝගිකයන් ඉල්ලුම් කරනු ලබන්නේ,

(1) භාණ්ඩය පරිභෝජනයේදී බාහිර ප්‍රතිලාභ ජනනය වැඩි බැවිනි.

(2) පෞද්ගලික ප්‍රතිලාභ වලට වඩා සමාජ ප්‍රතිලාභ සඳහා ය.

(3) බාහිර ප්‍රතිලාභ වලට වඩා පෞද්ගලික ප්‍රතිලාභ පදනම් කරගෙනය.

(4) බාහිරතා වළක්වා ගැනීම සඳහා ය.

(5) පරිභෝජනයේ දී ගෙවීමක් අවශ්‍යය නොවන බැවිනි. (......)

(46) ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් නිකුත් කරන ණය උපකරණ ලෙස නිවැරදිව ප්‍රකාශ වන්නේ,

(1) භාණ්ඩාගාර බැදුම්කර හා භාණ්ඩාගාර බිල්පත්.

(2) සමාගම් කොටස් හා රුපියල් ණය.

(3) භාණ්ඩාගාර බැඳුම්කර හා සමාගම් කොටස්.

(4) සමාගම් කොටස් හා ණයකර.

(5) වාණිජ පත්‍රිකා හා භාණ්ඩාගාර බැඳුම්කර. (......)

(47) වාණිජ බැංකුවල අධි සංචිත පවතින විට මහ බැංකු විසින් එම අතිරික්ත ද්‍රවශීලතා ඉවත් කිරීමට,

(1) ප්‍රති මිලදී ගැණුම් වෙන්දේසි පවත්වනු ලැබේ.

(2) ප්‍රති විකුණුම් වෙන්දේසි පවත්වනු ලැබේ.

(3) ශිෂ්ට ප්‍රයෝග ක්‍රියාත්මක කරනු ලැබේ.

(4) ණය සඳහා ඇප සුරැකුම් නියම කරනු ලැබේ.

(5) විවිධ වෙළඳ පල කටයුතු සක්‍රීය කරනු ලැබේ. (......)

(48) අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපලේ පොලී අනුපාත කොරිඩෝවේ පහළ නිමාව වන්නේ,

(1) ප්‍රති විකුණුම් අනුපාතය.

(2) ප්‍රති මිලදී ගැනීමේ අනුපාතය.

(3) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය.

(4) සුරැකුම්පත් විකිණීමේ පොලී අනුපාතය.

(5) වාණිජ බැංකුවේ ණය පොලී අනුපාතය. (......)

(49) නිෂ්පාදනයේ ඍණ බාහිරතාවයකි,

(1) මෝටර් රථ ධාවනය මඟින් සිදුවන පරිසර දූෂණය.

(2) දුම්වැටි පානය හා මත්පැන් පානය.

(3) පාසල් ළමුන්ට දිවා ආහාර ලබාදීම.

(4) නව තාක්‍ෂණය සඳහා යොමුවන අධ්‍යාපනය.

(5) කර්මාන්ත ශාලාවකින් මුදාහරින අපද්‍රව්‍ය වායුගෝලයට මුසුවීම. (......)

(50) පෞද්ගලික භාණ්ඩයක ලක්‍ෂණයක් වන්නේ කුමක් ද?

(1) පරිභෝජනයේ තරගකාරීත්වය හා ගෙවීමක් කරන පුද්ගලයාට පරිභෝජනය සීමාවීම.

(2) පෞද්ගලිකව හා සමාජීය වශයෙන් ප්‍රතිලාභ බහුල වීම.

(3) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැතිවීම හා ගෙවීමක් නොකළද පාරිභෝජනය බැහැර නොවීම.

(4) පරිභෝජනයේ දී විකල්ප තේරීම් බහුල වීම.

(5) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැති හා පරිභෝජනයේ සීමාකම් පැනවිය නොහැකි භාණ්ඩ වේ.

(......)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- 'අ', 'ආ' කොටස්වලින් අවම ප්‍රශ්න 02 ක් ලිවිය යුතුය.

## 'අ' කොටස

(01) (i) ඕනෑම සමාජ පද්ධතියකට ''තේරීමේ ප්‍රශ්නයට මුහුණ දීමට සිදුවී ඇත්තේ කවර සාධක නිසාද? එම තේරීම් ප්‍රශ්න 03 නම් කරන්න. (ල.04)

(ii) නිෂ්පාදනයේ දී හෝ පරිභෝජනයේ දී ආවස්ජිත පිරිවැයක් හට ගැනීමට හේතුවන සාධක කවරේද? ආවස්ජිත පිරිවැයක් නොමැති අවස්ථා දැකිය හැක්කේ කිනම් අවස්ථාවලදී ද? (ල.04)

(iii) රටක නිෂ්පාදනයේ ඵලදායිතාව තීරණය වන සාධක කවරේ ද? (ල.04)

(iv) රටක නිෂ්පාදනයේ ඵලදායිතාවය වැඩිකිරීම සඳහා ශ්‍රමයේ ඵලදායිතාවය ඉතා වැදගත් වූවකි. ශ්‍රමයේ ඵලදායිතාවය වැඩිවීමට බලපාන සාධක කවරේ ද? (ල.04)

(v) එක්තරා ආර්ථිකයක ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩිසම්පත් ප්‍රමාණයක් බෙදාවෙන් කිරීමටත්, පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය අඩු කිරීමටත් තීරණය කරන ලද්දේ නම් මෙය අනාගත ආර්ථිකය කෙරේ කෙබඳු බලපෑමක් ඇතිකරනු ලැබිය හැකිද? (ල.04)

(02) (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේදී යොදා ගනු ලබන උපකල්පන නම් කරන්න. (ල.04)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යොදාගෙන ආර්ථිකයේ සූක්ෂම හා සාර්ව විද්‍යාත්මක හැසිරීම් (භාවිතයන්) දැක්වීම එම කොටස් ඔබගේ උදාහරණ 03 බැගින් දක්වන්න. (ල.04)

(iii) ආර්ථික පද්ධතියක සාධනය ඇගැයීම් සඳහා යොදාගනු ලබන නිර්නායක නම් කරන්න. (ල.04)

(iv) රටක සත්‍ය නිමවුමේ වර්ධනය පැහැදිලි කර විභව නිමවුම් මට්ටම ඉක්මවා සත්‍ය නිමවුමේ වර්ධනයක් හට ගැනීමට ඉවහල් වන සාධක කවරේ ද? (ල.04)


(v) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේදී වෙළඳපල ආර්ථිකයක් සෑම විටම ප්‍රශස්ථ නොවේ. එසේ නොවීමට හේතුවන සාධක කවරේ ද? (ල.04)

(03) (i) පූර්ණ තරගකාරී වෙළඳපලක් හැම විටම ''මිල ගනුවකු ලෙස'' කටයුතු කරනු ලබයි. පැහැදිලි කරන්න. (ල.04)

(ii) නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය ලෙස හඳුනා ගන්නා පිරිවැය පැහැදිලි කරන්න. (ල.04)

(iii) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක තම භාණ්ඩය සැපයීම ආරම්භ කරනු ලබන්නේ කුමන මිලක් යටතේ ද? සැපයුම් වක්‍රය පැහැදිලි කරන්න. (ල.04)

(iv) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින නිෂ්පාදන ආයතනයක පිරිවැය වක්‍ර ඔබට සපයා ඇත.




(අ) මෙම ආයතනයේ ආර්ථික ලාභය ගණනය කරන්න. (ල.02)

(ආ) ආර්ථික ලාභය සම්බන්ධයෙන් මෙම නිෂ්පාදන ආයතනය පිළිබඳව කළ හැකි ප්‍රකාශයක් දක්වන්න. (ල.02)

(ඉ) ආයතනයට තව දුරටත් නිෂ්පාදනයේ යෙදී සිටිය හැකිද? පැහැදිලි කරන්න. (ල.02)

(ඊ) මෙම ආයතනයට නිෂ්පාදනයේ නිරතවිය හැකි අවම මිල කොපමණද? පැහැදිලි කරන්න. (ල.02)

(04) (i) ඉල්ලුම් ප්‍රමාණය හා ඉල්ලුමේ වෙනස අතර වෙනස පැහැදිලි කරන්න. (ල.04)

(ii) වෙළඳ පළ ඉල්ලුම කෙරේ බලපාන සාධක කවරේ ද? (ල.04)

(iii) එක්තරා වෙළඳපලක අලෙවිවන භාණ්ඩයක් පිළිබඳව ඉල්ලුම හා සැපයුම පිළිබඳ තොරතුරු සපයා ඇත. $Qd = 70 - 2P \quad Qs = -26 + 6P$

(අ) සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ල.02)

(ආ) සමතුලිත වීමේදී නම්‍යතාවය ගණනය කරන්න. (ල.02)

(ඇ) නම්‍යතා සංගුණකය අනුව මෙම භාණ්ඩය පිළිබඳ ඔබට කුමක් ප්‍රකාශ කළ හැකිද? (ල.02)

(ඉ) සමතුලිත මිලේදී පාරිභෝගික අතිරික්තය ගණනය කරන්න. (ල.02)

(ඊ) වෙළඳපලේ භාණ්ඩය සම්බන්ධයෙන් සැපයුම $Qs = 14 + 5P$ ලෙස වෙනස්විය. නව සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණ ද? (ල.02)

(උ) වෙළඳපල සැපයුම වෙනස්වීම සඳහා බලපෑ හැකි සාධක 04 ක් නම් කරන්න. (ල.02)

## 'ආ' කොටස

(05) (i) ජාතික ආදායම් ගණනය කිරීමේදී යොදාගනු ලබන්නේ ''ඵලදායී ආර්ථික ගණුදෙනු පමණි.'' ඵලදායි ආර්ථික ගණුදෙනු යන්න පැහැදිලි කරන්න. (ල.02)

(ii) ඵලදායි ආර්ථික ගණුදෙනු වුවද ජාතික ආදායම ගණනය කිරීමේදී බැහැර කරනු ලබයි. උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ල.04)

(iii) එක්තරා කල්පිත සංවෘත ආර්ථිකයක් පිළිබඳ දත්ත පහත දැක්වේ.

$$C = 200 + 0.75yd, \; I = 160, G = 60$$

$$x = 60, M = 180, T = 20$$

ඉහත දත්ත ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ඉතුරුම් ශ්‍රිතය

(ආ) දේශීය වියදම

(ඇ) දළ දේශීය නිෂ්පාදනය

(ඈ) $y = 1620$ ඉතුරුම් ගණනය කරන්න.

(ඉ) රාජ්‍ය අයවැය හිඟය / අතිරික්තය

(උ) බදු ගුණනය හා වියදම් ගුණනය

(ඌ) කාන්දුවීම් හා විදීම් මත ආර්ථිකයේ සමතුලිතය ලියා දක්වන්න. (ල. 2×7=14)

(06) (i) ජාතික ආදායම මැනීමේ ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ල.08)

(ii) විවෘත ආර්ථිකයක දළ දේශීය වියදම මත නිෂ්පාදිතය ගණනය කරන ආකාරය සමීකරණය මඟින් දක්වන්න. (ල.08)

(iii) පහත සඳහන් දෑ ජාතික ආදායම් ඇස්තමේන්තුවලට ඇතුලත් කරනු ලබන්නේ ද? නැද්ද යන්න හේතු සහිතව ලියන්න. (ල.01 බැගින්)

(අ) වාණිජ පත්‍රිකා මිලට ගැනීම

(ආ) වයස අවුරුදු 70 ට වැඩි ජනතාවට ලබාදෙන මහාජන ආධාර

(ඇ) නිවසේ මුරකරුට ලබාදෙන වැටුප්

(ඈ) පාවිච්චිකරන ලද පරිඝණක තොගයක් පාසල් සිසුන්ට විකිණීම

(07) (i) පහත සඳහන් ගණුදෙනු දළ දේශීය වියදම ගණනය කිරීමේදී ඇතුළත් කරනු ලබන වියදම් ශිර්ෂය ඉදිරියෙන් ලියන්න.

(1) නව විදුලිබලාගාරයක් සාම්පූර්වල ඉදිකිරීම.

(2) කොළඹ වරාය පුළුල් කිරීම.

(3) රාජ්‍ය අංශයේ නිමි තොගවල වටිනාකම වැඩිවීම.

(4) රජයේ පාසල් සඳහා කළමනාකරුවන් බඳවා ගැනීම.

(5) තෝරාගත් පාසල් සඳහා නව විද්‍යාගාර හා තාක්‍ෂණ ඒකක ඉදිකිරීම.

(6) ආණ්ඩුවේ පළාත් සභාවල පරිභෝජන වියදම් වැඩිවීම. (ල.10)

(ii) එක්තරා කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත ඔබට සපයා ඇත. (සංඛ්‍යා රු.මි.)

රු.මි.

| | | | |
|---|---|---|---|
| ස්වයං රැකියා ආදායම | 60 | ආදායම් බදු | 620 |
| ක්ෂයවීම් | 120 | පොලී ආදායම | 76 |
| විදේශ ශුද්ධ සාධක ආදායම් | 20 | සේවා නියුක්තියේ ආදායම | 54 |
| වැටුප් | 800 | සංක්‍රාම වියදම | 480 |
| සාංගමික ලාභ බදු | 80 | ශුද්ධ වක්‍ර බදු | 100 |
| නොබෙදූ ලාභ | 30 | ජනගහනය මිලියන | 20 |
| රජයේ පරිභෝජන වියදම | 300 | ගම්‍ය මිලදර්ශකය | 200 |

(1) සාධක මිල යටතේ දළ දේශීය ආදායම.

(2) සාධක මිල යටතේ දළ ජාතික ආදායම.

(3) වැයකළ හැකි පෞද්ගලික ආදායම.

(4) සාධක මිල යටතේ ඒක පුද්ගල දළ ජාතික ආදායම.

(5) සාධක මිල යටතේ මූර්ත දළ ජාතික නිෂ්පාදනය. (ල.10)

(08) (i) අවධමනය හා නිරුද්ධනය අතර වෙනස පැහැදිලි කරන්න. (ල.04)

(ii) හුවමාරු කිරීමේ මාධ්‍යයක් වශයෙන් මුදල් භාණ්ඩ හුවමාරු ආර්ථිකයේ පැවති දුෂ්කරතා ඉවත් කිරීමට කෙසේ වැදගත් වූයේ ද? පැහැදිලි කරන්න. (ල.04)

(iii) පුද්ගලයින් මුදල් සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ ඇයි? මුදලට ඇති ඉල්ලුම කෙරේ බලපාන සාධක කවරේ ද? (ල.04)

(iv) අධිබලැති මුදල් හෙවත් පදනම් මුදල් පැහැදිලිකර ආර්ථිකයේ මුදල් සැපයුම තුළ පදනම් මුදල් වල වැදගත්කම පැහැදිලි කරන්න. (ල.04)

(v) ඒකාබද්ධ මුදල් සැපයුමේ අන්තර්ගතය පැහැදිලිකර එහි ඇතුළත් ආසන්න මුදල් කවරේ ද? (ල.04)

(09) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු මොනවා ද? (ල.02)

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ 'මුල්‍ය ප්‍රතිපත්තිය' ක්‍රියාත්මක කිරීමට යොදා ගනු ලබන උපකරණ මොනවා ද? (ල.04)

(iii) වාණිජ බැංකුවක මුදල් මැවීමේ හැකියාව සීමාකරණ සාධක කවරේ ද? (ල.04)

(iv) මහ බැංකුවේ ක්‍රියාත්මක කරන ප්‍රති මිලදී ගැනීම් හා ප්‍රති විකුණුම් පැහැදිලිකර අන්තර් බැංකු ඒක්ෂණ ණය මුදල් වෙළඳපලේ නිත්‍ය පොලී අනුපාතය තීරණය වන ආකාරය දක්වන්න. (ල.04)

(v) වාණිජ බැංකුවක ශේෂ පත්‍රයක් ඔබට සපයා ඇත.

| වගකීම් | රු. මි. | වත්කම් | රු. මි. |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 2 500 | කාසි සංචිත | 1 700 |
| | | ණයදීම් | 800 |
| | 2 500 | | 2 500 |

(අ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% නම් බැංකුවට ණය දිය හැකි ප්‍රමාණය කොපමණද? (ල.02)

(ආ) ණය මැවිය හැකි ප්‍රසාරණ සංගුණකය කොපමණද? (ල.02)

(ඉ) අධි සංචිත මගින් මැවිය හැකි මුළු ණය මුදල කොපමණ ද? (ල.02)